**ශීර්ෂය - 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය එලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පූර්ව වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් අපහරණය කරන ලද ලී බඩු උපකරණ, පරිගණක උපකරණ හා කාර්යාල උපකරණ අයිතම 70 ක පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ ශේෂයෙන් අඩු කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් ලී බඩු හා කාර්යාල උපකරණ අයිතම 70 තක්සේරු කර අපහරණය කිරීමට නොහැකි වූ බැවින් එම වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට නොහැකි විය. එසේ නිර්දේශ කල භාණ්ඩ අපහරණය කිරීම සඳහා තක්සේරු කමිටුවක් පත්කර ඇති අතර 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සමග 2021 අපහරණ කටයුතුද කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමි. | නියමිත කාලය තුළ අදාල අයිතමවල පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ ශේෂයෙන් අඩුකර දැක්වීමට කටයුතු කළ යුතු වීම. |

#### (ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 891 (1) ප්‍රකාරව දැනට ඇප ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු. රෙ. 1647 (ඉ) ප්‍රකාරව දැනට වාහන ලැයිස්තුගත ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 454 (1) ප්‍රකාරව බඩු ලේඛන පොතක් යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු. රෙ. 454(1) ප්‍රකාරව දැනට බඩු ලේඛන පොතක් පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 454(1) හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොතක් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය | දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික මට්ටමේ රාජකාරී සිදු කරනු ලබන අභ්‍යන්තර විගණක, ගණකාධිකාරී, සහකාර අධ්‍යක්ෂ වැනි තනතුරු 6ක් පුරප්පාඩුව පවතින බැවින් මූල්‍ය පාලනය හා අභ්‍යන්තර පාලනය සඳහා විධිමත් පාලන පද්ධතියක් සකස් කර ගැනීමට නොහැකි | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වී ඇත. ඉදිරියේදී අවම වශයෙන් මෙම තනතුරු වලින් කිහිපයක් හෝ සම්පූර්ණ කර විධිමත් මූල්‍ය හා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 1982 අංක 33 දරන වකුෆ් පනතේ 45 වගන්තිය | පනතේ අදාල වගන්තිය මඟින් මුස්ලිම් ජාතිකයින්ගේ හා ඉස්ලාම් ආගමෙහි අභිවෘද්ධිය සඳහා ඉටුකළ හැකි කාර්යයන් 5 ක් දක්වා තිබුණද එම කාර්යයන් ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පනතේ සඳහන් පරිදි මුස්ලිම් ජාතිකයන්ගේ හා ඉස්ලාම් ආගමේ අභිවෘද්ධිය සඳහා ඉටුකල හැකි කාර්යන් 5 ඉටුකිරීම සඳහා වකුෆ් සභාවේ අවධානය යොමුකර අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවල අභිවෘධිය සැලකිල්ලට ගෙන දැනටමත් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. තවද ඉතිරි අංශ සම්බන්ධයෙන්ද අවධානය යොමු කිරීමට සැලසුම් කර ඇත. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.5, 4.5, 4.6 සහ 6.3 උප වගන්ති | ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.70,504ක සහ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.55,448 ක ණය මුදල් අවුරුදු 05 ක් ඉක්ම වුවද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවුරුදු 25ක සිට පවතින ණය ශේෂ වන අතර මෙම නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා අවස්ථා ගණනාවකදී උත්සහ දරා ඇතත් ණය කපා හැරීම සිදුව නොමැත. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 (1) (ඉ) | දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් සතොයක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දී ඇත. එම වාහනවල ක්‍රියාකාරීත්වය පිළිබඳව සොයා බලනු ලැබේ. අක්මුදල් නොලැබීම මත යම් අවස්ථාවල ප්‍රමාදයන් ඇතිවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iv) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 (3) වගන්තියෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 876 (3) | දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මගින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර චක්‍රලේඛ ප්‍රකාරව අරමුදල වසා දැමීමට හෝ නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | හජ් අරමුදලට අදාලව 2022 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති අතර එය විගණනයට ඉදිරිපත් කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (v) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | • 3.1 වගන්තිය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධයෙන් අළුත්වැඩියාවකට | ඉන්ධන පරීක්ෂාවෙන් පෙර හා පසු සම්පූර්ණ ධාරිතාවයෙන් ඉන්ධන යෙදිය යුතු අතර QR ක්‍රමය යටතේ ඉන්ධන ලබා ගැනීමේ අපහසුතාව මත ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි වී ඇත. අදාළ පිරවුම්හල වෙත ලිඛිතව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව නැවත ඉන්ධන පරික්ෂාවක් කළ යුතු වුවද දෙපාර්තමේන්තුවෙහි සියළුම වාහන සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් 2019 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. | ඉල්ලීමක් සිදු කලද යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. ඉදිරියේදී අමාත්‍යාංශය හරහා බලශක්ති අමාත්‍යාංශය දැනුවත් කර ඉන්ධන පරික්ෂාව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| | • 3.3 වගන්තිය | ඉන්ධන භාවිතයේ අහිතකර වෙනසක් ඇත්නම් එය හඳුනාගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 01 හි දක්වා ඇති ප්‍රවාහන සේවා සටහන් මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉහත අදහස් දැක්වීමෙහි සදහන් පරිදි ඉන්ධන ලබා ගැනීමේ අපහසුතාව මත මෙම ගැටලුව මතුවී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (vi) | 2015 ජූනි 29 දිනැති අංක 01/2015 හා 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | චක්‍රලේඛ ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් සෙලින්කෝ රක්ෂණ සමාගම වෙතින් රක්ෂණය කර තිබුණි. | නව රක්ෂණ සමාගම් වලින් මිල ගණන් කැඳවූවද පෙර පැවති රක්ෂණ වාරිකය යටතේම රක්ෂණය ආර්ථික වශයෙන් එලදායි බැවින් පෙර පැවති ආයතනයෙන්ම රක්ෂණය සිදු කරන ලදී. කෙසේ වෙතත් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01- 02 අතර සහ වසර 07 කට වැඩි කාලයක කාලයක සිට පවතින, පිළිවෙලින් රු.1,009,118 ක් සහ එකතුව රු.17,422,508 ක් වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දිනය වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලට අදාලව රඳවා ගැනීම් මුදල් වේ. ගොඩනැගිල්ලේ වැඩ කටයුතු මෙතෙක් නිම කර නොමැති බැවින් එම මුදල් නිදහස් කිරීමට අදාළ ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නිර්දේශ කර නොමැති නිසා එම මුදල නිදහස් කිරීමට නොහැකි වී ඇත. | අදාල තැන්පතු මුදල් නිදහස් කිරීම හෝ ආදායමට බැර කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලසුම් කිරීම

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති 02/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වේ. එසේ වුවද, 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමැතිය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාට යොමුකර එය නිවැරදි කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂයේ වියදම් දැරීම සඳහා අනුමැතිය ලබා දී තිබූ 2021 අංක 30 දරන විසර්ජන පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද 2022 සැප්තැම්බර් 02 දිනැති 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධිත) පනත සම්මත වීමෙන් පසු ඊට අනුකූලව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පළමු ක්‍රියාකාරී සැලැස්මේ වෙනස්කම් නොතිබූ බැවින් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් නොකරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2022 නොවැම්බර් 03 දින වේ. | 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාදයක් ඇති වුවත්, 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ප්‍රමාදයකින් තොරව නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. දැනට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කළ වාර්තාවේ සිංහල දෙමළ පරිවර්තන කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.3 ප්‍රසම්පාදනයන්**

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් | විගණන විමසුම මගින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් සැලකිල්ලට | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ |

| | | | |
|---|---|---|---|
| | බැහැරව රු.31,990 ක් සහ රු.44,900 ක් වැය කර පිළිවෙලින් කුඩා ශිතකරණයක් සහ මයික්‍රොවේව් උඳුනක් ද ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව රු.259,900 ක් වැය කර ලැප්ටොප් පරිගණකයක් ද මිලදී ගෙන තිබුණි. | ගෙන විධිමත් ආකාරයට ප්‍රසම්පාදන කටයුතු දැනට සිදුකරනු ලැබේ. | යුතු වීම. |
| (ආ) | ජාතික මිලාද් ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගීවුවන්ට ආහාරපාන සැපයීම සඳහා රු.274,500 ක වියදමක් දරා තිබුණද ඒ සම්බන්ධයෙන් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණි. | කොවිඩ් හේතුවෙන් කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි සිදු නොවීම මත උත්සවය පැවැත්වීම අවිනිශ්චිත විය. කෙසේ වෙතත් පසුව ගරු ඇමතිතුමාගේ උපදෙස් මත රාජ්‍ය උත්සවය පැවැත්වීමට සැලසුම් කර ඇත. උත්සවය කෙටි කාලයක් තුළ යෙදී තිබූ බැවින්, මේ සඳහා 1000 කට ආසන්න ප්‍රමාණයක් සහභාගී වූ නිසාත් දෙපාර්තමේන්තුව වෙත දීර්ඝකාලීනව සැපයීම් සේවා ලබාදෙන ආයතනය හරහා මිල ගණන් කැඳවා ඇස්තමේන්තුවේ සඳහන් වියදම් සිදුකර ඇති බව දන්වා සිටිමි. විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන විධිමත් ආකාරයට ප්‍රසම්පාදන කටයුතු දැනට සිදුකරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එකම දිනක එකම ආයතනයකින් රු. 450,000 ක්, රු. 310,100 ක් සහ රු. 310,100 ක් බැගින් වන වවුචර් 03 ක් මඟින් එකතුව රු.1,071,100 ක් වටිනා ලීබඩු උපකරණ මිලට ගෙන තිබූ අතර එම මිලදී ගැනීම, දෙපාර්තමේන්තු ටෙන්ඩර් කැඳවීම හරහා මිලදී ගැනීම් සීමාව වූ රු.500,000 නොඉක්මවීම සඳහා සිදු කර තිබූ බව නිරීක්ෂණය කෙරේ. | රාජ්‍ය ආයතනයක් වූ රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මෙම මිලදී ගැනීම් සිදුකර ඇත. විගණන විමසුම මගින් පෙන්වා දී ඇති කරුණු සැලකිල්ලට ගෙන විධිමත් ආකාරයට ප්‍රසම්පාදන කටයුතු දැනට සිදු කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වීම. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල ඉදිකර තිබූ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම දෙපාර්තමේන්තුව නමට පවරා ගැනීමට මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය මගින් මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු කරගෙන යනු ලැබේ. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් කළ යුතු වීම. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදි ස්ථාපිත කර තිබුණද අක්‍රියව පවතින දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල සඳහා වූ මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දිනය වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පැරණි වායුසමීකරණ පද්ධතිය ඉවත් කර නව වායු සමීකරණ පද්ධතියක් සවිකිරීමට හෝ එය නවීකරණය කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | නිශ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගත හැකි පරිදි විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රටඉඳි බෙදාහැරීමේ කටයුතු රාමසාන් උත්සව සමයේ සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ එම කටයුතු විධිමත්ව කල්වේලා ඇතුව සැලසුම් කර නොතිබුණි. ඒ හේතුවෙන් ඇතැම් අවස්ථාවල අවිධිමත් පරිදි ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව සැපයුම්කරුවන් තෝරා ගෙන තිබූ බවත් ඇතැම් අවස්ථාවල ආයතනයේ නිලධාරීන් කිහිපදෙනෙකුට අත්තිකාරම් ලබා දී එම කාර්යය විනිවිදභාවයකින් තොරව ඉටුකර ගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. | රටඉඳි ප්‍රවාහනය සඳහා සතොස ආයතනයේ වාහන ලබා ගැනීමට අපේක්ෂා කළත් එම වාහන නොලැබීම මත පෞද්ගලික ප්‍රවාහනකරුවන් කිහිප දෙනෙකුගෙන් මිල ගණන් ලබා ගත්තත් ඉන්ධන අර්බුදය හේතුවෙන් එම ප්‍රවාහනකරුවන්ද රටඉඳි ප්‍රවාහනය කිරීමට නොහැකි බව පසුව දැනුවත් කර ඇත. ඉන්ධන හිගය නිසාත් රාමසාන් මාසය ඉක්මවීමට පෙර රටඉඳි දිවයිනේ සියළුම පල්ලිවලට ප්‍රවාහනය කර අවසන් කල යුතු නිසාත් ප්‍රසම්පාදන කටයුතු නිසි ලෙස කළ නොහැකි වූ බව දන්වා සිටිමි. | රටඉඳි බෙදාහැරීම සම්බන්ධයෙන් විධිමත් පරිදි සැලසුම් කර නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 06 දෙනෙකුට දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නවාතැන් පහසුකම් සපයා තිබූ අතර එම නිලධාරීන්ගෙන් අය කර ගනු ලබන ආර්ථීක කුලිය, ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.2.3 හා 5.6 වගන්ති ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබා නොගෙන තීරණය කර තිබුණි. | නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ විධිමත් තක්සේරුවකින් පසුව කුලී අයකරගනු ලැබේ. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38(i)(ඊ) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වේ. තවද, මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරි සහ වගකීම ඉටුකිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු වේ. එසේ වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර අනුමත වූ දින සිට එම තනතුර පුරප්පාඩුව පවතින බැවින් අභ්‍යන්තර විගණන කාර්ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට හා ඵලදායි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. දැනට අභ්‍යන්තර විගණක, ගණකාධිකාරී තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කල නොහැකි බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුම් දී ඇත. කෙසේ වුවද අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේද සහය ඇතිව විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට අපේක්ෂා කරමි. දැනට සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද අභ්‍යන්තර විගණක පුරප්පාඩුව නිසා අධීක්ෂණ කටයුතුවල අඩුපාඩු දක්නට ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික පනතේ 41 වන වගන්තියේ විධිවිධාන පරිදි සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කලමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර අනුමත වූ දින සිට මේ දක්වා එම තනතුර පුරප්පාඩුව පවතින බැවින් අභ්‍යන්තර විගණන කාර්ය, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වී ඇත. කෙසේ වුවද අමාත්‍යාංශයේ | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | අභ්‍යන්තර විගණකගේද සහය ඇතිව විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමින් පවතී. | |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 123ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 109 ක් විය. මෙහි සංවර්ධන නිලධාරි තනතුරෙහි නිලධාරින් 7 දෙනෙකුගේ අතිරික්තයක් හා සෙසු තනතුරු සම්බන්ධයෙන් පුරප්පාඩු 21 ක් පවතින බව නිරීක්ෂණය විය. | 2021 සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමේදී පුරප්පාඩු නොසලකා අනුයුක්ත කර ඇති බැවින් සංවර්ධන නිලධාරීන් අතිරික්තයක් පවතී. එසේ වුවද මේ වනවිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව වැටුප් රහිත දේශීය/ විදේශීය නිවාඩු ලබා සංවර්ධන නිලධාරීන් 09 දෙනෙකු නිවාඩු ගොස් ඇත. පුරප්පාඩු සම්පූර්ණ කර දෙන මෙන් කිහිප වතාවක් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කළ ද සමහර පුරප්පාඩු දැනට සම්පූර්ණ කල නොහැකි බව දැනුම් දී ඇත. | පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතු වීම. |
| (ආ) 2001 අගෝස්තු 22 දිනැති 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 5 ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 05 ක් ඉක්මවූ නිලධාරීන් 45 දෙනෙකු සඳහා ස්ථාන | වසර 05 කට වැඩි සේවා කාලයක් ඇති සංවර්ධන නිලධාරි, කළමනාකරණ සේවා නිලධාරි, රියදුරු සහ කාර්යාල සේවක සේවය නිලධාරීන් වාර්ෂිකව ස්ථානමාරු අයදුම් කලද, මෙම දෙපාර්තමේන්තුව ප්‍රියමනාප ස්ථානයක් නොවන බැවින් හා වෙනත් නිලධාරියෙකු ස්ථානමාරු සඳහා මෙම | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. මේ අතුරින් නිලධාරීන් 10 දෙනෙකු වසර 15කට වැඩි කාලයක් දෙපාර්තමේන්තුව තුළ සේවය කර තිබුණි.

දෙපාර්තමේන්තුවට අයදුම් නොකරන බැවින් අනුප්‍රාප්තිකයකු ලබාදීමට ඇති ගැටළුව මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ස්ථානමාරු සිදුනොකෙරුවද වසර 05ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය සෑම වසරකම වාර්ෂික ස්ථානමාරු ලේඛනයට ඇතුලත් කරනු ලබන බව දන්වමි.